කුලියාපිටිය නගර සභාව
කුරුණෑගල දිස්ත්‍රික්කය

--------------------------------

1. <u>මූල්‍ය ප්‍රකාශන</u>

.11 <u>මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම</u>

සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන 2015 අප්‍රේල් 08 දින ද ඉකුත් වර්ෂයට අදාල මූල්‍ය ප්‍රකාශන 2014 මාර්තු 27 දින ද විගණනයට ඉදිරිපත් කර තිබූ අතර සමාලෝචිත වර්ෂයේ විගණකාධිපති වාර්තාව 2015 අගෝස්තු 13 දින සභාවේ ලේකම්වරයා වෙත යවන ලදී.

1.2 <u>මතය</u>

මෙම වාර්තාවේ 1.3 ජේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2014 දෙසැම්බර් 31 දිනට කුලියාපිටිය නගර සභාවේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය පොදුවේ පිළිගත් ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

1.3 <u>මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම</u>

1.3.1 <u>ගිණුම්කරණ අඩුපාඩු</u>

පහත සඳහන් ගිණුම්කරණ අඩුපාඩු නිරීක්ෂණය විය.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල උසාවි දඩ ආදායම රු.290,167 ක් වුවද, එය රු.152,500 ක් ලෙස දැක්වීම මත වර්ෂයේ ආදායම රු.137,667 ක් අඩුවෙන් දක්වා තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු උසාවි දඩ ආදායම රු.266,167 ක් වූ අතර එය ණයගැතියන් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ආ) අංක 46-00866-1 දරන රු.3,000,000 ක ස්ථාවර තැන්පතුවට අදාලව 2012 වර්ෂය සඳහා ලද රු.112,500 ක පොළී ආදායම සමාලෝචිත වර්ෂයේ ආදායම් ලෙස ගිණුම්ගත කර තිබූ අතර, අංක 44-00125-1 දරන රු.1,457,685 ක ස්ථාවර තැන්පතුව සඳහා 2014 වර්ෂයට අදාල පොළී ආදායම් හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි. එමෙන්ම නිශ්චිත හේතු දැක්වීමකින් තොරව ජර්නල් සටහන් අංක 08 මගින් රු.1,803,948 ක් වූ ස්ථාවර තැන්පතු ශේෂයක් සමුච්චිත අරමුදලට එරෙහිව කපා හැර තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂය තුල පරිත්‍යාග වශයෙන් ලද රු.4,106,500 ක මෝටර් රථවල වටිනාකම වර්ෂයේ ප්‍රාග්ධන ආදායම් හා වත්කම් වශයෙන් ගිණුම්ගත කර නොතිබුණි.

(ඈ) භාණ්ඩ සමීක්ෂණ වාර්තා අනුව සමාලෝචිත වර්ෂය අවසානයට ගබඩා තොග ශේෂය රු.4,015,238 ක් වුවද මූල්‍ය ප්‍රකාශනවල එය රු.22,612,596 ක් ලෙස දක්වා තිබීම මත තොග ශේෂය රු.18,597,358 ක් වැඩියෙන් දක්වා තිබුණි.

(ඉ) ඉදිරි වර්ෂය වෙනුවෙන් සමාලෝචිත වර්ෂයේ ලද රු.284,005 ක් වූ වරිපනම් බදු ආදායම් කලින් ලද ආදායම් (ණයහිමියන්) ලෙස ගිණුම්ගත නොකර සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු වරිපනම් බදු ආදායම් ණයගැතියන්ගෙන් අඩුකර දක්වා තිබුණි.

1.3.2 <u>නොසැසඳූ පාලන ගිණුම්</u>

සමාලෝචිත වර්ෂයට අදාලව අවසන් ශේෂය යටතේ ගිණුම් විෂයයන් 08 කට අදාලව ගිණුම අනුව සහ අදාල ලේඛණ අතර රු. 4,193,206 ක නොසැසඳීම් පැවතුණි.

1.3.3 <u>ලැබිය යුතු හා ගෙවිය යුතු ගිණුම්</u>

පහත කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) ලැබිය යුතු ගිණුම් තුල ආදායම් ණයගැතියන් රු.25,142,884 ක් වූ අතර ඒ තුල භිඟ වරිපනම් රු.9,877,653 ක්ද, හිඟ ජල ගාස්තු රු.3,689,672 ක්ද හා ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,590,894 ක්ද පැවතුණි.

(ආ) සමාලෝචිත වර්ෂය තුල ඉටුකල "සුමුදුමාවත" පැතිකාණු ඉදි කිරීමේ කර්මාන්තය වෙනුවෙන් ලැබිය යුතු රු.490,000 ක් ලැබිය යුතු ආදායම් ලෙස ගිණුම්ගත කර නොතිබුණි.

(ඇ) 2014 දෙසැම්බර් 31 දිනට ගෙවිය යුතු ගිණුම් ශේෂවල වටිනාකම රු.49,170,785 ක් විය. මින් දළ වශයෙන් 34% ක් වූ රු. 16,874,880 ක් වසර 3 කට වැඩි කාලයක සිට පැවත එන ශේෂයන් වේ.

(ඈ) සමාලෝචිත වර්ෂය අවසානයට මිශ්‍ර තැන්පතු ශේෂය රු.5,990,545 ක් වූ අතර, 2007 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා කාලයක සිට පවතින රු.1,524,728 ක තැන්පතු ශේෂ 22 ක් නිරවුල් නොකර මිශ්‍ර තැන්පතු යටතේ පැවතුණි.

1.3.4 <u>විගණනය සඳහා සාක්ෂි නොවීම</u>

අවශ්‍ය තොරතුරු විගණනයට ඉදිරිපත් නොවීම නිසා එකතුව රු.34,270,508 ක ගනුදෙනු පිළිබඳව විස්තරාත්මක පරීක්ෂාවක් කළ නොහැකි විය.

02 <u>මූල්‍ය සමාලෝචනය</u>

2.1 <u>මූල්‍ය ප්‍රතිඵලය</u>

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2014 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා සභාවේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.14,886,643 ක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ පුනරාවර්තන වියදම ඉක්මවූ ආදායම රු.16,402,197 ක් වීමෙන් මූල්‍ය ප්‍රතිඵලයෙහි රු.1,515,554 ක පිරිහීමක් පැවතුණි. මෙකී මූල්‍ය ප්‍රතිඵලයට රු.2,267,605 ක් වූ ප්‍රාග්ධන ආධාර හා රු.18,255,480 ක් වූ ප්‍රාග්ධන වැය ගැලපූ විට සමාලෝචිත වර්ෂයට අදාල මූල්‍ය ප්‍රතිඵලය රු.1,101,232 ක ඌනතාවයක් බවට පත්ව තිබුණි.

2.2 <u>විග්‍රහාත්මක මූල්‍ය සමාලෝචනය</u>

පහත සඳහන් කරුණු නිරීක්ෂණය කරනු ලැබේ.

(අ) සමාලෝචිත වර්ෂයට අදාල සභාවේ මුළු පුනරාවර්තන ආදායම වූ රු.102,528,915 න් දළ වශයෙන් 48% ක් වූ රු.49,086,013 ක්ම සභාවේ උත්පාදිත ආදායම් නොවන උසාවි දඩ, මුද්දර ගාස්තු, වැටුප් ප්‍රතිපූර්ණ වැනි දීමනා ස්වරූපයේ ලැබීම්වලින් සමන්විත විය. එමෙන්ම ප්‍රාග්ධන ආදායම වූ රු.2,267,605 ක මුළු ප්‍රමාණයම ගමනැගුම, මගනැගුම වැනි ප්‍රභවයන් මත වෙනත් ආයතන මගින් බල ප්‍රදේශයේ සංවර්ධන කාර්යයන් සඳහා ලබා දී ඇති මුදල් විය.

(ආ) සමාලෝචිත වර්ෂයට අදාල මුළු පුනරාවර්තන වියදම වූ රු.87,642,272 න් දළ වශයෙන් 64% ක් වූ රු.55,833,993 ක් පෞද්ගලික පඩිනඩි සඳහා වියදම වූ අතර ඉන් දළ වශයෙන් 63% ක් වූ රු.35,227,594 ක් වැටුප් ප්‍රතිපූර්ණ ලෙස පළාත් පාලන කොමසාරිස් වෙතින් ලැබී වෙනත් ආදායම් යටතේ ගිණුම්ගත කර තිබුණි. එමෙන්ම ප්‍රාග්ධන වියදම වූ රු.18,255,480 න් දළ වශයෙන් 87% ක් වූ රු.15,987,787 ක් පමණක් සභා අරමුදලින් වැය කර තිබුණි.

2.3 <u>ආදායම් පරිපාලනය</u>

2.3.1 <u>වරිපනම් බදු</u>

සමාලෝචිත වර්ෂය අවසානයට වරිපනම් ඒකක 4454 යටතේ හිඟය රු.9,877,653 ක් වූ අතර එය වාර්ෂික බිල් කිරීම වූ රු.14,856,776 සමඟ සැසඳීමේදී දළ වශයෙන් 66% ක් පමණ විය.

2.3.2 <u>විනෝද බදු</u>

සභා බල ප්‍රදේශය තුල සිනමා ශාලා 03 ක් පැවති අතර 2013 ජනවාරි මාසයෙන් පසුව අදාල සිනමා ශාලාවල ප්‍රවේශ පත් මුද්‍රා තබා නොතිබුණි. සිනමා ශාලා මාසිකව චිත්‍රපට සංස්ථාවට යවනු ලබන වාර්තා පදනම් කරගෙන සභාව විසින් විනෝද බදු ගණනය කිරීම සිදුකර තිබූ අතර ඒ අනුව 2013 වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ සිනමා ශාලාවලින් අයවන විනොද බදු ආදායම 45% සිට 59% දක්වා පරාසයකින් පහල ගොස් තිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ විනෝද බදු ආදායම රු.599,517 ක්ව පැවතුණි.

2.3.3 <u>ජල ආදායම්</u>

සභාවට අයත් ජල පවිත්‍රාගාරයක් යොදා ගනිමින් සභාව විසින්ම ජල ව්‍යාපෘතිය ක්‍රියාත්මක කර තිබූ අතර සමාලෝචිත වර්ෂය අවසානයට ජල පාරිභෝගිකයින් 1855 දෙනෙකුට ජලය සපයා තිබුණද තොග ජල මීටර් නොමැති වීමෙන් හා මාසික නිෂ්පාදනය, බෙදා හැරීම වැනි තොරතුරු නොමැති වීම හේතුවෙන් ජල ව්‍යාපෘතියේ ඵලදායීතාවය පිළිබඳ ඇගයීමක් නොතිබුණි. එමෙන්ම සමාලෝචිත වර්ෂය අවසානයට හිඟ ජල ගාස්තු ශේෂය රු.3,689,672 ක් වූ අතර එය වාර්ෂික බිල් කිරීමෙන් 76% ක් විය.

2.3.4 <u>උසාවි දඩ හා මුද්දර ගාස්තු</u>

පළාත් සභාවේ ප්‍රධාන ලේකම්වරයාගෙන් සමාලෝචිත වර්ෂය අවසානයට ලැබිය යුතු මුද්දර ගාස්තු රු.5,590,894 ක් වූ අතර, ලැබිය යුතු උසාවි දඩ ප්‍රමාණය හඳුනාගෙන ගිණුම්ගත කර නොතිබුණි.

03. මෙහෙයුම් සමාලෝචනය

3.1 කාර්ය සාධන ඇගයීම

සමාලෝචිත වර්ෂය තුල සභාව විසින් ඉටු කිරීමට සැලසුම් කර තිබූ රු.310,000 ක් වූ සුභ සාධන කාර්යයන් 07 ක් ඉටුකර නොතිබුණි.

3.2 කළමණාකරන අකාර්යක්ෂමතා

(අ) වරිපනම් බදු ක්‍රියාවලිය

සභාවේ වරිපනම් බදු ක්‍රියාවලිය සඳහා පරිඝනක  වැඩ සටහනක් භාවිතා කර තිබුණු අතර එහි පහත සඳහන් අඩුපාඩු නිරීක්ෂණය කරනු ලැබේ.

I. පරිඝනක වැඩ සටහන සඳහා අදාල නිලධාරි මට්ටම් අනුව රහස් අංක ලබාදීම මගින් නිසි අධීක්ෂණයක් සිදුවී නොමැති වීම  සහ එය ක්‍රියාත්මක කරන නිලධාරින්ට නිසි අනුමැතියකින් තොරව ඕනෑම තොරතුරක් වෙනස්කල හැකි වීම.

II. පරිඝනක වැඩ සටහන හඳුන්වා දුන්  2003 වර්ෂයේ  සිට 2013 දක්වා වසර 10 කට අධික කාලයක් එකම නිලධාරිනියක් මෙම පරිඝනක වැඩ සටහනෙහි රාජකාරි සඳහා යොදවා තිබීම හා රාජකාරි මාරු කිරීමක් හෝ වෙනත් සේවකයින් පුහුණු කිරීමක් කර නොතිබුණි.

III. නිලධාරින් විසින් කුවිතාන්සි වල අංක වෙනස් කිරිම මගින්  බදුකරුවන් විසින්  ගෙවන වරිපනම් බදු වංචා කර ඇති බව අනාවරණය වි තිබු  අතර ඒ සම්බන්ධව මුලික පරික්ෂණයක් සිදුකරන ලෙසට පලාත් පාලන කොමසාරිස්වරයා විසින්  2014 ඔක්තෝබර් මාසයේදි සභා ලේකම්වරයා වෙත දන්වා එවා තිබුණි.

(ආ) ජල ව්‍යාපෘතිය

2012 වර්ෂයේ සිට ජල ව්‍යාපෘතිය සඳහා පරිඝනක වැඩ සටහනක් භාවිතා කර තිබුණද එහි පහත සඳහන් දුර්වලතා නිරීක්ෂණය විය.

i. අදාල පරිඝනක වැඩ සටහන සඳහා රහස් අංක ලබාදීමක් සිදුකර නොතිබීම සහ එය නිසි අධීක්ෂණයකටද ලක්ව නොතිබීම.

ii. එමෙන්ම අදාල පරිඝනක වැඩ සටහන ක්‍රියාත්මක කරනු ලබන අයට ඕනෑම දත්තයක් වෙනස් කිරීමේ හැකියාව පැවතීම.

iii. වර්ෂ 02 කට වැඩි කාලයක සිට පරිඝනක වැඩ සටහන හා ලේඛන යන දෙකම ජල ව්‍යාපෘතිය සඳහා භාවිතා කරමින් පැවතීම හා 2014 දෙසැම්බර් වන විටද පරිඝනක වැඩ සටහන  නිසි පරිදි ක්‍රියාත්මකව නොපැවතීම.

iv. 2014 දෙසැම්බර් 31 දිනට ලේඛන අනුව හිග ශේෂ හා පරිඝනක වැඩ සටහන අනුව හිග ශේෂ අතර විශාල වෙනස්කම්  තිබිම.

04 <u>පද්ධති හා පාලන</u>

පහත සඳහන් පද්ධති හා පාලන ක්ෂේත්‍ර කෙරෙහි විශේෂ අවධානය යොමු  කරනු ලැබේ.

(අ) ගිණුම්කරණය
(ආ) අයවැය පාලනය
(ඇ) ආදායම්  පරිපාලනය
(ඈ) වත්කම්  කළමනාකරණය